

# පෙර පාසලට ප්‍රමිතියක්

**ද**රුවන් ගේ යහපත් අනාගතය උදෙසා මව් පිය වැඩිහිටියෝ බලවත් සේ වෙහෙසෙති. ඒ රටක ජීවනාලිය ඔවුන් වන හෙයිනි. විශ්ව ගම්මානයේ උරෙනුර ගැටී දේශයට කීර්තිමත් දරුවන් බිහිකිරීමේ ආයෝජනයට රාජ්‍ය මැදිහත් වීම වන්නේ ද ඒ නිසාම ය. එහි ලා බස්නාහිර පළාත සිය පුරෝගාමී මෙහෙවරට අත්පොත් තැබූයේ මීට දෙවසරකට ඉහත දී ය.

මුල් ළමා විය සංවර්ධනයට කැපවුණු පෙර පාසල් පද්ධතියක් ගොඩනැඟීම ඔවුන් ගේ මූලික අරමුණ ය. බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන පෙර පාසල් අධ්‍යාපන ඒකකය එකී මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ යෙදී සිටියි. එහි වත්මන් අධ්‍යක්ෂලෙස කටයුතු කරන ජී.විමල් සරච්චන්ද්‍ර මහතා සිය පෙර පාසල් කවයේ සංවර්ධනයට උරදෙන අයුරු අප සමඟ මෙසේ විස්තර කළේ ය. පෙර පාසල වයස අවුරුදු 3 5 අතර දරුවන් සඳහා කිනම් හෝ නමකින් පවත්වාගෙන යන දරුවන් ගේ සංවර්ධනය සඳහා කටයුතු කරන ආයතනයකි. පෙර පාසල මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථානය, මොන්ටිසෝරිය, සිඟිති නිකේතනය ආදී විවිධ නම්වලින් මෙම ආයතනය හඳුන්වනු ලැබේ. මෙරට පෙර පාසල් අධ්‍යාපනය කෙරෙහි රාජ්‍ය මැදිහත්වීම පළමු වරට සිදු කෙරුණේ 80 දශකයේ දී ය.

1987 නොවැම්බර් 20 වැනි දින ගැසට් පත්‍රයට අනුව 13 වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි උප ලේඛනයේ තුන් වැනි පරිශිෂ්ටයේ පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සඳහන් වේ.

ඒ පවත්වාගෙන යනු ලබන පෙර පාසල් පරිපාලනය, අධීක්ෂණය කිරීම හා කළමනාකරණය සේ ම පෙර පාසල් පිළිබඳ උපදේශක කමිටුව පත් කිරීම, පෙර පාසල් සඳහා ප්‍රමිතීන් ඉදිරිපත් කිරීම හා පෙර පාසල් ලියා පදිංචි කිරීම පිළිබඳ එහි සවිස්තරාත්මකව



**බස්නාහිර පළාත් පෙර පාසල් අධ්‍යක්ෂ**
**ජී.විමල් සරච්චන්ද්‍ර මහතා**

දක්වා ඇත. දරුවකු ගේ පෙර පාසල් අවධිය වශයෙන් සැලකෙන අවුරුදු 3 ආරම්භයේ සිට අවුරුදු 5 සම්පූර්ණ වන තෙක් කාලසීමාව තුළ ළමා විය සංවර්ධනය සහ නිසි මඟ පෙන්වීම මෙම ප්‍රඥප්තියේ අරමුණ වෙයි.

පෙර පාසල් ගුරුවරයකු, නිසි අධ්‍යාපනයක් හා විශේෂිත පුහුණුවක් ලැබූ අයකු විය යුතුය. මුල් අවධියේ පෙර පාසල් ගුරුවරයකු සතු වූ සුදුසුකම්වලට අමතරව පසු කාලීනව අ.පො.ස (සා.පෙළ) ද ඇතුළත් විය. ඒ අනුව ඔවුන්, මව් බස, ගණිතය සමඟ විෂයයන් හයකින් සමත් වී තිබිය යුතු ය. 2005 ජනවාරි පළමු වැනිදා සිට ක්‍රියාවට නැඟුණු බස්නාහිර පළාත් ප්‍රඥප්තියට අනුව, ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව තවත් සුදුසුකම් ඔවුන් විසින් සපුරාලනු ලැබිය යුතුය.

දැනට පවත්වාගෙන යනු ලබන පෙර පාසල්වලින් 65% ක් ම පෞද්ගලික අංශය සතුය. සෙසු පෙර පාසල් නගර සභා මඟින් නොමිලයේ පවත්වාගෙන යනු ලබයි. විමධ්‍යගත අය වැය යටතේ පළාත් සභාවන්ට වෙන් කෙරෙන ප්‍රතිපාදන මඟින් පෙර පාසල් සඳහා ප්‍රතිපාදන වෙන් කෙරෙනමුත් මේ සඳහා සෘජු රාජ්‍ය මැදිහත් වීමක් සිදු නොවේ.

## පෙර පාසැලේ බිහි වීම

මාරියා මොන්ටිසෝරි මැතිණිය පෙර පාසල් ආදී කර්තෘවරියයි. ඇ විසින් බිහි කළ මෙම ක්‍රමය හඳුන්වනු ලැබූයේ A.M.T ක්‍රමය යනුවෙනි. මෙය එක්තරා ගුරු කුලයකි. නාගරික ප්‍රදේශයන්ට පමණක් සීමා වූ මෙම පෙර පාසල් ක්‍රමය ක්‍රමිකව ග්‍රාමීය ප්‍රදේශ කරා ඇදී ගියේ ය. එහි ගෞරවය හිමි වන්නේ සර්වෝදය ආයතනයටයි. එතෙක් ගම් මට්ටමින් පැවැති පෙර පාසල් විධිමත් ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය පසුබිම සර්වෝදය මඟින් සැපැයිණි. එහි ලා විවිධ පාඨමාලාවන් පවත්වනු ලැබිණි.

එම යුගයේ පෙර පාසලක් පවත්වා ගෙන යෑමේ එකම සුදුසුකම වූයේ පෙර පාසල් පාඨමාලාවක් හදාරා තිබීමයි. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්ට අනුව දරුවකු විධිමත් පාසලට ඇතුළත් කිරීම වයස අවුරුදු 6 දක්වා ඉහළ ගියේය. ඒ අනුව ඊට පහළ වයස් කාණ්ඩවල දරුවන්ට පෙර පාසල් අධ්‍යාපනය දීමට තීරණය විය. මීට සමගාමී වැඩ සටහන් සර්වෝදය ආයතනය මඟින් ඇරඹිණි. එහි ප්‍රතිඵලයක් ලෙස වර්තමානය වන විට පෙර පාසල් දරුවන්ට නිසි අධ්‍යාපනය ලබා දීමේහිලා උරදෙන ගුරු භවතුන් පිරිසක් බිහි විය.

## පෙර පාසල් ගුරුවරයා

පෙර පාසල් ගුරුවරයකු, නිසි අධ්‍යාපනයක් හා විශේෂිත පුහුණුවක් ලැබූ අයකු විය යුතුය. මුල් අවධියේ පෙර පාසල් ගුරුවරයකු සතු වූ සුදුසුකම්වලට අමතරව පසු කාලීනව අ.පො.ස (සා.පෙළ) ද ඇතුළත් විය. ඒ අනුව ඔවුන්, මව් බස, ගණිතය සමඟ විෂයයන් හයකින් සමත් වී තිබිය යුතු ය. 2005 ජනවාරි පළමු වැනිදා සිට ක්‍රියාවට නැඟුණු බස්නාහිර පළාත් ප්‍රඥප්තියට අනුව, ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව තවත් සුදුසුකම් ඔවුන් විසින් සපුරාලනු ලැබිය යුතුය.



අ.පො.ස. (උ.පෙළ) විෂයන් තුනකින් ද සමත් වීම එම නව සුදුසුකමයි. මෙහි දී සපුරාලිය යුතු පෙර පාසල් පාඨමාලා දැනට ජාතික මට්ටමින් පවත්වාගෙන යනු ලැබේ. සබරගමු විශ්වවිද්‍යාලය විවෘත විශ්වවිද්‍යාලය, ජාතික අධ්‍යාපන ආයතනය මඟින් සහ තෘතිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ලියාපදිංචි කළ පෞද්ගලික ආයතන මඟින් ද එම පාඨමාලා පැවැත්වෙයි. අධ්‍යාපන මනෝ විද්‍යාව, අධ්‍යාපන විද්‍යාව හා ඉගෙනුම් ක්‍රම, ළමා සංවර්ධනය, පෙර පාසල් කළමනාකරණය හා සංවර්ධනය, සෞඛ්‍ය පෝෂණය හා ශාරීරික අධ්‍යාපනය, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්, භාෂා කුසලතා සංවර්ධනය, මූලික ගණිත සංකල්ප, සෞන්දර්ය නිර්මාණ කුසලතා, සදාචාර අධ්‍යාපනය හා සාරධර්ම ආදී විෂයන් පෙර පාසල් පාඨමාලාවක දී ඉගැන්වෙයි.

## පෙර පාසලක ප්‍රමිතිය

බස්නාහිර පළාත් ප්‍රඥප්තියට අනුව පෙර පාසලක් දරුවන්ට වඩාත් ප්‍රියමනාප සහ ප්‍රමිතියක් සහිත විය යුතු ය. ඒ සඳහා සුදුසු පරිසරයකින් හෙබි ස්ථාන සහ දරුවන් ගේ ක්‍රියාකාරකම්වලට අවශ්‍ය පහසුකම් මෙම පෙර පාසල් සතු වීම අත්‍යවශ්‍ය ය. එක් දරුවකු සඳහා අවම වශයෙන් වර්ග අඩි 10 ක ගොඩනැගිලි ඉඩකඩ මෙහි දී වෙන් විය යුතු ය. එසේම ළමයින් 25 කට එක් වැසිකිළියක් බැගින් වැසිකිළි පද්ධතියක් සකස් කර තිබීම ද අත්‍යවශ්‍ය ය. ආරක්ෂිත තාප්පයකින් පෙර පාසල් භූමිය මැනවින් ආරක්ෂා කිරීමත් ප්‍රථමාධාර පෙට්ටියක් පවත්වාගෙන යාමත් අවම සුදුසුකම් යටතට ගැනේ. ඊට අමතරව දුව පැන ක්‍රීඩා කිරීම සඳහා දරුවන්ට ප්‍රමාණවත් ඉඩකඩක් සහිත ගෙමිදුලක් තිබිය යුතුය. එකී ක්‍රීඩා හා ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පහසුකම් ද සැපැයිය යුතුය.

ලී බඩු උපකරණ ප්‍රමාණවත් පරිදි සේම මානසික ප්‍රබෝධයට ඉවහල් වන පරිදි විය යුතු සේම ආගමික වතාවත් සඳහා සුදුසු ස්ථානයක් ද වෙන් විය යුතු ය. මෙහි ලා සැලකිය යුතු වැදගත් ම කරුණ වන්නේ ළමයින් 20 දෙනකුට එක් ගුරුවරියක් සිටීම යි. එහි දී විශේෂිත ළමයින් වේ නම්, ළමයින් පස් දෙනකුට එක් ගුරුවරියක් බැගින් සිටිය යුතු ය. පෙර පාසලක් ඉදි කිරීමේ දී අන්තරායකාරී ස්ථානයන්ගෙන් මීටර 100 ක පමණ දුරින් ස්ථාපනය කිරීමට වග බලා ගත යුතු ය. පෙර පාසලකට දරුවා ඇතුළත් කිරීමේ දී ඉහත කී ප්‍රමිතීන්ට එම පෙර පාසල අනුකූලදැයි මව්පියන් සැළකිලිමත් විය යුතු ය.

බස්නාහිර පළාත් ප්‍රඥප්තියට අනුව පෙර පාසලක් දරුවන්ට වඩාත් ප්‍රියමනාප සහ ප්‍රමිතියක් සහිත විය යුතු ය. ඒ සඳහා සුදුසු පරිසරයකින් හෙබි ස්ථාන සහ දරුවන් ගේ ක්‍රියාකාරකම්වලට අවශ්‍ය පහසුකම් මෙම පෙර පාසල් සතු වීම අත්‍යවශ්‍ය ය. එක් දරුවකු සඳහා අවම වශයෙන් වර්ග අඩි 10 ක ගොඩනැගිලි ඉඩකඩ මෙහි දී වෙන් විය යුතු ය. එසේම ළමයින් 25 කට එක් වැසිකිළියක් බැගින් වැසිකිළි පද්ධතියක් සකස් කර තිබීම ද අත්‍යවශ්‍ය ය.



පෙර පාසලකට ඇතුළත් කරන දරුවකු චතුර්විධ ක්‍රියාකාරකම්වල නියුතු වෙයි. එනම් සවන්දීම, කථනය, පෙර ලිවීම, හා පෙර කිවීම යි. එසේම පෙර පාසල් දරුවකු ගේ භාෂා කුසලතාව වචන 300 පමණ ය. ඔහු / ඇය විධිමත් පාසලට යන විට එය 4000 5000 ක් අතර විය යුතු ය. මෙවැනි තත්ත්වයකට ළමයකු ගෙන ඒම භාරදූර කාර්යයකි. මෙහි වගකීමෙන් වැඩි ප්‍රතිශතය පෙර පාසල් ගුරුවරිය සතු වෙයි.

එමඟින් දරුවාට අපේක්ෂිත නිසි අධ්‍යාපනය ලැබෙනු නොඅනුමාන ය. ඒවා නොතකමින් පෙර පාසල්වලට ඇතුළු කිරීමෙන් දරුවාට වන හානියට එකී පාලිකාවන් සේ ම මව් පිය භාරකරුවෝ ද එක සේ වගකිව යුත්තෝ ය.

## පෙර පාසල් ලියාපදිංචි කිරීම

මීළඟට ඔබ අවධානය යොමු කළ යුතු වැදගත් කරුණ වන්නේ අපේක්ෂිත ප්‍රමතීන්ට ළඟා වූ පෙර පාසල් ලියාපදිංචිය පිළිබඳ යි. ඒ සඳහා වන ඉල්ලුම් පත්‍රයේ 1 කොටස හඳුනා ගැනීමේ තොරතුරු සඳහා ය. 11 කොටස ශිෂ්‍ය තොරතුරු සඳහා ය. ඒ අනුව පන්ති නම් කර තිබේ නම්, ඒවා පිළිබඳ තොරතුරු, වයස් කාණ්ඩ, ජන වර්ගය, පන්ති පවත්වාගෙන යනු ලබන මාධ්‍යය හා ශාරීරික මානසික ඌනතා ඇති දරුවන් පිළිබඳ තොරතුරු ද සඳහන් කළ යුතු ය. 111 කොටස ගුරු තොරතුරු සඳහා වෙන් වෙයි.


ඒ අනුව එකී ගුරු භවතුන් අවශ්‍ය සුදුසුකම් සපුරා තිබේදැයි සැලකිල්ලට ගැනේ. IV කොටසේ මුල්‍ය තොරතුරු දසකොටසෙහි භෞතික පහසුකම් පිළිබඳ තොරතුරු ද ඇතුළත් කළ යුතු ය. එහි අවසාන කොටස මඟින් පෙර පාසලේ පරිපාලනමය තොරතුරු සම්බන්ධ බස්නාහිර පළාත් ප්‍රඥප්තියට අනුකූල වන පරිදි අවශ්‍ය සියලු සාධක පෙර පාසල සතුදැයි පරීක්ෂා කර බලනු ලැබේ. ඒ අනුව ලියාපදිංචියට සුදුසු සහ එසේ ලියා පදිංචි කළ පෙර පාසල් සඳහා ලියාපදිංචි සහතිකයක් සහ අංකයක් ලබා දෙනු ඇත. බස්නාහිර පළාත තුළ දැනට ලියාපදිංචිය සඳහා අයැදුම් කළ පෙර පාසල් ගණන (2007.01.01) දිනට 2335 වන අතර, ඒ අතරින් ලියාපදිංචි ගුරු සංඛ්‍යාව 4336 වන අතර ළමයින් සංඛ්‍යාව 70776 කි. මෙලෙස ලියාපදිංචි කළ ප්‍රමිතීන්ට අනුකූල පෙර පාසල්වල සේවය කරන සුදුසුකම් ලත් ගුරුවරු සඳහා නිල හැඳුනුම්පතක් නිකුත් කිරීමට ද අවශ්‍ය පසුබිම සැකසෙමින් පවතී.

එසේම ලියාපදිංචි වීම සඳහා අයැදුම් කළ ද ඊට සුදුසුකම් නොලත් පෙර පාසල් සුදුසු තත්ත්වයට පත් කිරීමේ කාර්යයට ද පෙර පාසල් අධ්‍යක්ෂ සරච්චන්ද්‍ර මහතා කටයුතු යොදා ඇත්තේ ය. සංවර්ධන නිලධාරීන් 22 ක ගේ සහයෝගයෙන් කලාප මට්ටමින් මෙකී වැඩසටහන දැනට ක්‍රියාත්මක වෙයි. ඒ අනුව 100 ක ගෙන් යුත් දෙමාපිය කණ්ඩායම් සහ 50 දෙනකුගෙන් යුතු ගුරු කණ්ඩායම් වශයෙන් පුහුණු කිරීමේ හා දැනුවත් කිරීමේ වැඩමුළු දියත් කෙරෙයි. පෙර පාසල් ගුරුවරුන්ගේ සහ පාලිකාවන්ගේ දැනුම හා වෘත්තීය කුසලතා සංවර්ධනය කිරීම හා යාවත්කාලීන කිරීම එමඟින් අපේක්ෂිත ය. එනම් පෙර පාසලක් සම්බන්ධයෙන් දෙමාපියන්ගේ භූමිකාව සහ ගුරුවරුන්ගේ භූමිකාව පිළිබඳ දැනුවත් කිරීම සිදු කෙරෙයි.

දරුවාට සෙනෙහස ආදරය දැක්වීම ඔහු / ඇයට හානියකැයි පවතින සමාජ මතය දෙමාපියන් කෙරෙන් බැහැර විය යුත්තකි. රැකවරණය, පිළිගැනීම හා අගැයීම ආදියෙන් යුත් ආදර්ශමත් පරිසරයක් නිවස තුළ දරුවාට සලසා තිබීම දෙමාපියන් ගේ වගකීමකි.

පෙර පාසලකට ඇතුළත් කරන දරුවකු චතුර්විධ ක්‍රියාකාරකම්වල නියුතු වෙයි. එනම් සවන්දීම, කථනය, පෙර ලිවීම, හා පෙර කිවීම යි. එසේම පෙර පාසල් දරුවකු ගේ භාෂා කුසලතාව වචන 300 පමණ ය. ඔහු / ඇය විධිමත් පාසලට යන විට එය 4000 5000 ක් අතර විය යුතු ය. මෙවැනි තත්ත්වයකට ළමයකු ගෙන ඒම භාරදූර කාර්යයකි.

මෙහි වගකීමෙන් වැඩි ප්‍රතිශතය පෙර පාසල් ගුරුවරිය සතු වෙයි. එකී කාර්යයට ඔවුන්ට සහය නොවන ඇතැම් දෙමාපියෝ පෙර පාසලට ඇතුළත් කළ මොහොතේ පටන් අකුරු කියන්න ලියන්න උත්සාහ ගැනීම අදූරදර්ශී ක්‍රියාවකි.



ත්‍රේරීම, වෙන්කිරීම, යා කිරීම ආදී විවිධ සංකල්ප පිළිබඳ දරුවාට කියා දුන්නත් ඔහුට ග්‍රහණය කර ගත හැක්කේ එක් වරකට එක් සංකල්පයක් පමණකි. මෙනිසා පෙර පාසල් දරුවා ගේ මනසට ගෝචර වන පරිදි ක්‍රියා කිරීමට අප උගත යුතු ය. තනිවම කළ හැකි දෑ දරුවාට තනිව කිරීමට ඉඩදීම ස්ව ආත්ම ශක්තිය වර්ධනයට රැකුලකි. මෙහි ලා බස්නාහිර පළාත් පෙර පාසල් අධ්‍යාපන ඒකකය මඟින් ළමා කඳවුරක් පැවැත්වූයේ අත්හදා බැලීමක් වශයෙනි. පෙර පාසල් 10 ක ළමයි 50 ක් ඊට සහභාගී වූහ. දෙමාපියන් නැති ව සිය දෛනික කටයුතු කිරීමට ළමයින් තුළ ස්ව ශක්ති වර්ධනය, මෙම නේවාසික කඳවුරෙහි අරමුණ විය.

## පෙර පාසල් උපදේශක කමිටුව

අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයා විසින් මෙම උපදේශක කමිටුව පත්කරනු ලැබේ. ඒ යටතේ

* පළාත් අධ්‍යාපන ලේකම්
* පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
* පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
* පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්
* පළාත් පාලන කොමසාරිස්
* ජාතික අධ්‍යාපන ආයතනයෙන් පත් කරනු ලබන පෙර පාසල් විෂය පිළිබඳ
* අධ්‍යාපනඥයකු
* ඉහත කී උපදේශක කමිටුවේ කාර්යභාරය සුවිශේෂී ය. එනම්,
* පෙර පාසල් සම්බන්ධයෙන් අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, අධීක්ෂණය, උපදෙස් දීම, පසු විපරම,
* විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමයින්ට ගැළපෙන ඉදිරි අධ්‍යාපන වැඩසටහන් සැකසීම.
* දෙමාපියන් දැනුවත් කිරීම.
* පෙර පාසල් විෂය නිර්දේශයන් නියම කිරීම හා සංශෝධනය කිරීම

බස්නාහිර පළාත් ප්‍රඥප්තියට අනුකූලව ඊට පටහැනිව පවත්වාගෙන යනු ලබන පෙර පාසලක් හෝ බලය හිමි නිලධාරින් ගේ රාජකාරී කටයුතුවලට බාධා කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය. ඒ අනුව එවැනි වරදකට හසුවන්නකුට මුදලින් රුපියල් දහදාහක දඩයක් හෝ මාස හයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාර ගත කිරීම හෝ එකී දඬුවම් දෙකටම හෝ ලක් විය හැකි ය.

සටහන

**නිලූකා ඩී.තිලකරත්න**

බස්නාහිර පළාත් ප්‍රඥප්තියට අනුකූලව ඊට පටහැනිව පවත්වාගෙන යනු ලබන පෙර පාසලක් හෝ බලය හිමි නිලධාරින් ගේ රාජකාරී කටයුතුවලට බාධා කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය. ඒ අනුව එවැනි වරදකට හසුවන්නකුට මුදලින් රුපියල් දහදාහක දඩයක් හෝ මාස හයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාර ගත කිරීම හෝ එකී දඬුවම් දෙකටම හෝ ලක් විය හැකි ය.

